# සූර්ය බලයෙන් ඉතිරි කරන්න. එය ඉතා පහසුයි.

සාමාන්‍ය නිවාසයක් වසරකට $1,000[1] කට වඩා සූර්ය බලය භාවිතයෙන් ඉතිරි කරයි. වික්ටෝරියානුවන් 200,000කට වැඩි පිරිසක් සමඟ එකතු වී ඔබේ නිවසට හෝ කුලී දේපළවලට සූර්ය බලය ස්ථාපනය කිරීමට වට්ටමක් ලබාගන්න.

Solar Victoria

VICTORIA State Government



## අපගේ වට්ටම් ගැන

Solar Victoria හි Solar Homes වැඩසටහන වික්ටෝරියානුවන්ට බලශක්ති පිරිවැය ඉතිරි කර ගැනීමට උපකාර කිරීම සඳහා සූර්ය පැනල, බැටරි සහ බලශක්ති කාර්යක්ෂම උණු වතුර පද්ධති ස්ථාපනය කිරීම සඳහා වට්ටම් ලබාදේ.

**සූර්ය පැනල (PV) වට්ටම්**
සුදුසුකම් ලත් නිවාසයකට සූර්ය පැනල (PV) සවිකිරීමේදී **$1,400 ක් දක්වා වට්ටම්** ලබාගත හැක. ඉදිවෙමින් පවතින නිවාස සඳහා ද සූර්ය පැනල වට්ටම් ලබාගත හැක.

අනුමත අයදුම්කරුවන් සඳහා පොලී රහිත ණය ද ලබාදේ.

**කුලී දේපල සඳහා සූර්ය බලශක්ති වට්ටම්**
සුදුසුකම් ලත් කුලී සපයන්නන්ට සූර්ය පැනල (PV) ස්ථාපනය කිරීමේ පිරිවැය මත එක් මූල්‍ය වර්ෂයකට කුලී දේපල දෙකක් දක්වා **$1,400 ක් දක්වා වට්ටමක්** ලබාගත හැකිය.

අනුමත අයදුම්කරුවන් සඳහා පොලී රහිත ණය ද ලබාදේ.

**උණු වතුර පද්ධති සඳහා වට්ටම්**
සුදුසුකම් ලත් නිවාසයකට සූර්ය උණු වතුර හෝ තාප පොම්ප උණු වතුර පද්ධතියට වැයවන වියදමෙන් **$1,000 ක් දක්වා වට්ටම්** ලබාගත හැක.

> සුදුසුකම් ලබන නිවාසවලට සූර්ය පැනල (PV) වට්ටමට අමතරව උණු වතුර පද්ධති වට්ටමට ද අයදුම් කළහැක.

**සූර්ය බල බැටරි වට්ටම්**
සුදුසුකම් ලත් නිවාසයකට සූර්ය බල බැටරි සඳහා වියදමෙන් **$2,950 ක් දක්වා වට්ටම්** ලබාගත හැක.

## මා අයදුම් කරන්නේ කෙසේද?

**පියවර 1: ඔබේ සුදුසුකම පරීක්ෂා කරන්න**
වට්ටම සඳහා ඔබේ සුදුසුකම තහවුරු කරගන්න - ඔබට මීළඟ පිටුවේ සුදුසුකම් ලැබීමේ නිර්ණායක ලැයිස්තුව පරීක්ෂා කළ හැක.

**පියවර 2: මිල කැඳවුමක් ලබාගන්න**
ඔබට Solar Victoria හි සහතික කළ සූර්ය පද්ධති වෙළෙන්දෙකු සම්බන්ධ කරගෙන මිල ගණන්ක් ලබාගත යුතු වේ. ඔබට ඔවුන්ගේ තොරතුරු Solar Victoria හි solar.vic.gov.au/retailers වෙබ් අඩවියෙන් ලබා ගත හැක

ඔබ සූර්ය පද්ධති වෙළෙන්දෙකු සම්බන්ධ කරගන්නා විට, ඔබ Solar Victoria වට්ටම් සඳහා අයදුම් කිරීමට අදහස් කරන බව ඔවුන්ට දැනුම්දිය යුතුය.

වට්ටම් සඳහා සුදුසුකම් ලැබීමට, එම භාණ්ඩ Solar Victoria හි අනුමත කළ භාණ්ඩ ලැයිස්තුවේ[2] සඳහන් භාණ්ඩ විය යුතුය.

**පියවර 3: ඔබේ වට්ටම් සඳහා අයදුම් කරන්න**
ඔබ අවසර ලත් සූර්ය පද්ධති වෙළෙන්දෙකුගෙන් මිල ගණන් ලබාගත් පසු ඔබට Solar Victoria පාරිභෝගික පෝර්ටලය හරහා වට්ටමට අයදුම් කළහැක. ඔබට මෙතැනින් පොලී රහිත ණය සඳහා ද අයදුම් කළ හැක.

ඔබේ සූර්ය පද්ධති වෙළෙන්දා ඔබ වෙනුවෙන් වට්ටම ඉල්ලා සිටින අතර වට්ටම් මුදල ඔබේ පද්ධතියේ සහ ස්ථාපනයේ සමස්ත පිරිවැයෙන් අඩු කරනු ලැබේ. ස්ථාපනය කළ පසු කිසියම් හිඟ ශේෂයක් ඇත්නම් එය ඔබේ සූර්ය පද්ධති වෙළෙන්දාට ගෙවීමට ඔබ වගකිව යුතුය.

## අපව සම්බන්ධ කරගන්න

ඔබට **solar.vic.gov.au** ඔස්සේ වැඩසටහන පිළිබඳ වැඩි විස්තර සොයා ගත හැකි අතර එසේ නොමැතිනම් 1300 376 393 (කාර්යාල වේලාවන් තුළ) අපගේ පාරිභෝගික සේවා කණ්ඩායම අමතන්න.

ඔබ ඔබේ භාෂාවෙන් අපට කතා කිරීමට කැමති නම්, 131 450 ඔස්සේ ජාතික පරිවර්තන සේවාව ඇමතීමෙන් ඔබට නොමිලේ දුරකථන පරිවර්තන සේවා වෙත ප්‍රවේශ විය හැක.

## ප්‍රවේශය

ඔබට මෙම ප්‍රකාශනය වෙනත් ආකෘතියකින් ලබාගැනීමට අවශ්‍ය නම්: කරුණාකර **comms@team.solar.vic.gov.au** ඔස්සේ Solar Victoria සම්බන්ධ කරගන්න

මෙම ලේඛණය අන්තර්ජාලයේ **solar.vic.gov.au** හි ද ලබාගත හැක

1 සාමාන්‍ය 6.16 Kw වහල පද්ධතියක් මත පදනම්ව
2 www.solar.vic.gov.au/approved-products

**ප්‍රතිලාභ**

- බලශක්ති බිල් අඩුකරගන්න
- ඔබේ බලශක්ති සැපයුම වැඩි කරගන්න
- සූර්ය බලශක්තියට අදාල රැකියා නිර්මාණයට සහය වන්න
- ගෝලීය උණුසුමට එරෙහිව සටන්කරන්න

# වට්ටම් වර්ග සහ සුදුසුකම් නිර්ණායක

## සූර්ය පැනල (PV) වට්ටම් – $1,400 ක් දක්වා

**ඔබ සූර්ය පැනල (PV) වට්ටමක් ලබා ගැනීමට සුදුසුකම් ලැබීමට නම්:**

- ඔබ පද්ධතිය ස්ථාපනය කිරීමට නියමිත දැනට පවතින දේපලක පදිංචි-හිමිකරු හෝ ඉදිවෙමින් පවතින නිවසක හිමිකරු විය යුතුය
- සියලුම අයිතිකරුවන්ගේ ඒකාබද්ධ ගෘහ බදු අය කළ හැකි ආදායම වසරකට$180,000 ට වඩා අඩු විය යුතුය[1]
- Solar Homes වැඩසටහන යටතේ හිමිකරුවෙකු ලෙස ඔබට දැනටමත් සූර්ය පැනල (PV) වට්ටමක් හෝ සූර්ය බැටරි වට්ටමක් ලැබී නොතිබිය යුතුය
- දේපල ඩොලර් මිලියන 3 ට අඩු වටිනාකමකින් යුත් දැනට පවතින දේපලක් විය යුතුය නැතහොත් ඉදිවෙමින් පවතින නිවසක් නම් එය අවසන් වන විට ඩොලර් මිලියන 3 ට අඩු අගයක් ගත යුතුය
- දේපල ලිපිනයට දැනටමත් Solar Homes වැඩසටහන යටතේ සූර්ය පැනල (PV) වට්ටමක් හෝ සූර්ය බැටරි වට්ටමක් ලැබී නොතිබිය යුතුය[2]
- මෙම දේපලෙහි මීට පෙර දැනට පවතින සූර්ය PV පද්ධතියක් ස්ථාපනය කර නොතිබිය යුතුය (2009 නොවැම්බර් 1 ට පෙර නොවේ නම් හැර).

## කුලී දේපල සඳහා සූර්ය පැනල (PV) වට්ටම් – $1,400 ක් දක්වා

**ඔබ වික්ටෝරියානු කුලී සැපයුම්කරුවෙකු නම්, ඔබේ කුලී දේපල සඳහා වට්ටමක් ලබා ගැනීමට ඔබට සුදුසුකම් ලැබීමට නම්:**

- ඔබේ කුලී නිවැසියන්ගේ ඒකාබද්ධ ගෘහ ආදායම වසරකට $180,000 ට වඩා අඩු විය යුතුය[1]
- දේපලෙහි වටිනාකම ඩොලර් මිලියන 3 ට අඩු වන අතර දැනටමත් සූර්ය පැනල (PV) සවි කර නොතිබිය යුතුය
- දේපල ලිපිනයට දැනටමත් Solar Homes වැඩසටහන යටතේ සූර්ය පැනල (PV) වට්ටමක් හෝ සූර්ය බැටරි වට්ටමක් ලැබී නොතිබිය යුතුය[2]
- *කුලී සපයන්නා සහ කුලීකරු අතර Solar Homes වැඩසටහන් ගිවිසුමක් කුලී සැපයුම්කරු සහ සියලුම කුලී නිවැසියන් විසින් අත්සන් කර තිබිය යුතුය*
- දේපල දැනට කුලී ගිවිසුමක් ඔස්සේ ලබාදී තිබිය යුතුය.

## උණු වතුර පද්ධති වට්ටම් - $1,000 දක්වා

**අනුමත සූර්ය උණු වතුර හෝ තාප පොම්ප උණු වතුර පද්ධතියක් සඳහා උණු වතුර පද්ධති වට්ටමක් ලබා ගැනීමට ඔබ සුදුසුකම් ලැබීමට නම්:**

- පද්ධතිය ස්ථාපනය කිරීමට නියමිත දේපලෙහි හිමිකරු ඔබ විය යුතුය
- සියලුම අයිතිකරුවන්ගේ ඒකාබද්ධ ගෘහ බදු අය කළ හැකි ආදායම වසරකට$180,000 ට වඩා අඩු විය යුතුය[1]
- ඔබට දැනටමත් Solar Homes වැඩසටහන යටතේ සූර්ය බැටරි වට්ටමක් හෝ උණු වතුර පද්ධති වට්ටමක් ලැබී නොතිබිය යුතුය
- එය දැනට පවතින දේපලක් වන අතර එහි වටිනාකම ඩොලර් මිලියන 3 ට අඩු විය යුතුය
- Solar Homes වැඩසටහන යටතේ හිමිකරුවෙක් ලෙස දේපල ලිපිනයට දැනටමත් සූර්ය බැටරි වට්ටමක් හෝ උණු වතුර වට්ටමක් ලැබී නොතිබිය යුතුය[2]
- ප්‍රතිස්ථාපනය කළ යුතු උණු වතුර පද්ධතිය මිලදී ගත් දින සිට අවම වශයෙන් වසර තුනක් පැරණි විය යුතුය

## සූර්ය බැටරි වට්ටම්– $2,950 දක්වා

**ඔබ සූර්ය බැටරි වට්ටමක් ලබා ගැනීමට සුදුසුකම් ලැබීමට නම්:**

- පද්ධතිය ස්ථාපනය කිරීමට නියමිත දේපලෙහි හිමිකරු ඔබ විය යුතුය
- සියලුම අයිතිකරුවන්ගේ ඒකාබද්ධ ගෘහ බදු අය කළ හැකි ආදායම වසරකට$180,000 ට වඩා අඩු විය යුතුය[1]
- ඔබට දැනටමත් Solar Homes වැඩසටහන යටතේ හිමිකරුවෙකු ලෙස වට්ටමක් ලැබී නොතිබිය යුතුය
- එය දැනට පවතින දේපලක් වන අතර එහි වටිනාකම ඩොලර් මිලියන 3 ට අඩු විය යුතුය
- Solar Homes වැඩසටහන යටතේ දේපල ලිපිනයට දැනටමත් වට්ටමක් ලැබී නොතිබිය යුතුය[2]
- දේපල සඳහා දැනටමත් 5kW ට සමාන හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත සූර්ය PV පැනල තිබිය යුතුය, නැතහොත් සූර්ය බැටරි ස්ථාපනයට සමගාමීව එකක් ස්ථාපනය කිරීමට කටයුතු කරමින් සිටිය යුතුය
- බැටරියක් ආරක්ෂිතව ජාලයට සම්බන්ධ කිරීම සඳහා ඔබේ බෙදා හරින ලද ජාල සේවා සපයන්නා (DNSP) වෙතින් පූර්ව අනුමැතිය ලබා තිබිය යුතුය
- දේපලෙහි දැනටමත් බලශක්ති ගබඩා පද්ධතියක් නොතිබිය යුතුය
- නිවැසියන් ලබා ගන්නා අගය උපරිම කිරීම සඳහා බැටරි අත්හදා බැලීම්වලට සහභාගී වීම පිළිබඳ ඔවුන්ගේ බෙදාහැරීමේ ජාල සේවා සපයන්නාගෙන් තොරතුරු ලබා ගැනීමට හිමිකරු/හිමියන් එකඟ විය යුතුය.

1 පසුගිය වසර දෙකේ බදු අය කළ හැකි ආදායමෙන් ඕනෑම එකක් මත පදනම්ව
2 අපගේ පාරිභෝගික සේවා කණ්ඩායමට 1300 376 393 ඔස්සේ සම්බන්ධ විය හැකි අතර දේපලක් මීට පෙර Solar Homes වැඩසටහනට සහභාගී වී තිබේද යන්න තහවුරු කර ගත හැක.

© වික්ටෝරියා ප්‍රාන්තයේ බලශක්ති, පරිසර සහ දේශගුණික ක්‍රියා දෙපාර්තමේන්තුව 2023

**වියාචනය:** මෙම ලේඛණය ඔබට සහය විය හැකි නමුත් වික්ටෝරියානු ප්‍රාන්තය හෝ එහි සේවකයින් මෙම ලේඛණයේ කිසිදු වරදක් නොමැති බව හෝ ඔබගේ විශේෂ අවස්ථා සඳහාම අදාල බවට සහතික නොවේ, එබැවින් මෙම ලේඛණය මත පදනම්ව ඔබට සිදුවන වරදක්, පාඩුවක් හෝ වෙනත් හානියක් සඳහා වගකීමට ඔවුන් බැඳී නොමැත.